// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2181/21 - 2020 ජූනි මස 25 වැනි බ්‍රහස්පතින්දා - 2020.06.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 15/2014

**2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 49 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 58 වන වගන්තිය යටතේ, නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජූනි මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග 2020 ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන (නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමලේඛනය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් (මෙහි මින්මතු "නාමලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන් සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමලේඛනයක් පවත්වාගෙන යා යුතු ය.

1A - G 032392 — 22 (2020/06)
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. නාමලේඛනයෙහි, නිපුණ ඉදිකිරීම් වැඩකරුවන් ගේ, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකරුවන්ගේ, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ -

(අ) නම්,

(ආ) සම්බන්ධීකරණ තොරතුරු.

(ඇ) නිපුණතාවය සතුවන්නා වූ අදාළ වෘත්තීය හෝ කර්මාන්තය හෝ ශිල්පය,

(ඈ) ලියාපදිංචි කාණ්ඩය සහ විශේෂත්වය,

(ඉ) ලියාපදංචි අංකය, සහ

(ඊ) ලියාපදිංචි දිනය සහ වර්තමාන ලියාපදිංචි කාල සීමාව,

ඇතුළත් විය යුතුය.

4. නාමලේඛනය, නිපුණ ඉදිකිරීම් වැඩකරුවන්ගේ, ඉදිකිරීම් වැඩබිම් අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ කාර්මික නිලධරයන්ගේ සහ ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්ගේ නාමාවලියක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එය කාර්යාල වේලාව අතරතුර දී මහජනතාව විසින් පරීක්ෂා කළ හැකි ය

5. මේ නියෝගවල -

"ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු වෙනත් වෘත්තිකයන්" යන්නෙන්, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ සඳහන් කරනු ලබන සුදුසුකම්ලත් තැනැත්තන් නොවන, අදාළ වෘත්තිය මණ්ඩලය යටතේ වෘත්තීයමය වශයෙන් පිළිගනු ලැබූ තැනැත්තකු අදහස් වේ.

07 - 251